කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2022

2025 - මාර්තු

**BCOME 3025 - ව්‍යවසායකත්වය**

ප්‍රශ්න සංඛ්‍යාව : (හතරයි ) 04 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

සිද්ධි අධ්‍යයනය

පවනි පාසැල් අවධියේදී ලැජ්ජාශීලී නිහඬ දැරියක ලෙස සලකනු ලැබීය. ඇය තම පංතියේ ළමයින්ගේ ඇසුරෙන් වැළකී සිටි අතර ඇගේ පරිසරයේ 'කලාත්මක හා දෘෂ්‍ය අංග' ගවේෂණය කිරීමට වැඩි කාලයක් ගත කළාය. ඇය 'ඇස්වලින් දේවල් දකින්නේ කෙසේද' යන්න ගැන කොතරම් උද්යෝගිමත් වූවාද කිවහොත් වෙන කිසිවක් ඇය කෙරෙහි උනන්දුවක් නොදැක්වීය. ඇය තමන් සතුව කැමරාවක් ඇතැයි යන උපකල්පනයෙන් ලෝකය දෙස බැලීය

ඇය වටා ඇති දේවල් දෙස 'කැමරාවේ ඇස' හරහා බැලීය. ඇය විවිධ කෝණවලින් ඡායාරූප ගැනීම රහ දැක්වීය. එයින් ඇය ඉහල සතුටක් ලැබීය. ඇය දක්ෂ සිසුවියක් වුවද ඇගේ ගුරුවරු ඇගේ මව මෙන්ම ඇය ගැන ද සැලකිලිමත් වූහ. කෙසේ වෙතත්, ඇගේ පියා, රාජ්‍ය නර්තන කණ්ඩායමේ නර්තන ශිල්පියෙකු සහ වේදිකා කළමණාකරුවෙකු ලෙස කටයුතු කළහ. ඔහුට දියණිය සමඟ ජීවිත කාලය පුරාම මඟ හැරුණු අවස්ථාවන් පිළිබඳ වැටහීමක් තිබුණු අතර, ඔහුගේ දියණියගේ හැකීම් සහ රුචිකත්වයන්ට සහය විය. තවද, ඔවුන් අනුගමනය කිරීමට ඇයව දිරිමත් කළේය.

කෙසේ වෙතත් පවනි මෙසේ අධිෂ්ඨාන කරගෙන සිටිබව ඇය නිතර මතක් කරයි. "මා කුඩා කල සිටම ස්වාධීන වීමටත් සිතැඟි පරිදි අවශ්‍ය දේ මිලදීගෙන ජීවිතය විඳීමටත් සංචාරය කිරීමටත් ඉතාමත් රුචිකත්වයක් දක්වයි". කාලය ගතවීමත් සමග සෙමින් ගොඩනැගුණු පවනි විශාල හැඩැති කැමරා කාච යොදා ගනිමින් ඇය සති අන්තයේ නුවර සංචාරක ගම්මානයක පදික වේදිකාවල විකුණන ලද නිශ්චල පින්තූර ගැනීමට පටන් ගත්තාය. ඇය උපයාගත් මුදල් නිසා වඩාත් නවීන කැමරාවක් මිලදී ගැනීමට ඇයට හැකි වූ අතර, 'නිශ්චලතාවන් චලනය වනවා සේ පෙනෙන අතර සෑම දෙයක්ම ගතික බවක් පෙනෙන්නට තිබුණි' යන සුවිශේෂී තාක්ෂණයක් සැකසීමට ඇයට හැකි විය. මිනිසුන් ඇගේ අද්විතීය පින්තූර වලට කැමති වූ අතර ඇගේ ඡායාරූප බොහොමයක් සෑම සතියකම අලෙවි විය. ඉන්පසු ඇගේ පින්තූර සඳහා ලී රාමු කිහිපයක් මිල දී ගත් අතර, ඇය ඒවා වර්ණ ගන්වා අලංකාර කරමින් විකිණීමටද පටන් ගත්තාය.

වසරකට පමණ පසු, නුවර වෙත පැමිණි ඇමරිකානු කාන්තාවක් ඇගේ කලාව දුටු පවනිට නිව්යෝර්ක් නගරයේ කළමනාකරණය කරමින් සිටි සංගමයේ ඡායාරූප ශිල්පියා ලෙස රැකියාවක් ලබා දුන්නාය. පවනි

එම යෝජනාව පිළිගෙන නිව්යෝර්ක් බලා ගියාය. ඇය නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයේ ඡායාරූපකරණය පිළිබඳ පන්තිවලට සහභාගී වීමට පටන් ගත් අතර කළු-සුදු ඡායාරූපකරණයේ වඩාත් විවිධාකාර ශිල්පීය ක්‍රම දියුණු කළාය. ඇය මේවා පරිගණක ග්‍රැෆික්ස් සමඟ සංයෝජනය කර මෙම ක්ෂේත්‍රයේ විශේෂඥතාවයක් වර්ධනය කර ගත්තාය.

'ඇගේ සිහින සඳහා මුදල් ඉපැයීමට' අධිෂ්ඨාන කරගෙන සිටි පවනි, ඇමරිකානු කාන්තා සංගමයේ නැවත එක්වීමකදී (Reunion) සිය වැඩ කටයුතු ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා සිටියේය. ඇගේ ඡායාරූප, අලංකාර කරන ලද රාමු තුළ, ඉතා සාර්ථක විය; බොහෝමයක් එදින රාත්‍රියේ විකුණනු ලැබූ අතර ඇයට තවත් ව්‍යාපෘති සඳහා බොහෝ දීමනා ලැබුණි. පවනි ඉතා ධෛර්යමත් විය. ඇය නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වූ නමුත් ඇගේ පියා අසනීප වූ විට අනපේක්ෂිත ලෙස නුවර වෙත යාමට සිදුවිය. පවනි සිය ගුවන් ගමනේදී සුපුන් නම් චිත්‍ර ශිල්පියෙකු මුණගැසුණි, පසුව ඔහු ඇගේ ස්වාමිපුරුෂයා බවට පත් විය. ඔවුන් වසර දෙකකට පසු නැවත නිව්යෝර්ක් වෙත ගිය නමුත් ඇය සේවය කරමින් සිටි සංගමය වෙනත් ඡායාරූප ශිල්පියෙකු බඳවා ගෙන තිබිණි.

සියලුම දේ ඇයට නැවත ආරම්භ කිරීමට සිදුවිය. වඩාත් ශක්තිමත් වූ ඇය, ඉදිරිපත් කරන නිෂ්පාදන සහ සේවාවන් සඳහා ඉතා ආකර්ශනීය වෙබ් අඩවියක් නිර්මාණය කළ අතර ඒ හේතුවෙන් ව්‍යාපෘති සඳහා ඇණවුම් පැමිණීමට පටන් ගත්තාය. ඇය දිගින් දිගටම සිය උපකරණ යාවත්කාලීන කරමින් උසස් තත්ත්වයේ ඡායාරූප නිර්මාණය කළාය. ඇය උනන්දු හා දක්ෂ වූ අතර ඡායාරූපකරණය සහ පරිගණක ග්‍රැෆික්ස් ඒකාබද්ධ කරන ශිල්පීය ක්‍රම සොයා ගත් අතර, පසුව ඇය කෝප්ප, කැලැන්ඩර් සහ කොට්ට වැනි පුළුල් පරාසයක භාණ්ඩ එකතුවක් මත ඇසට හසු වූ ඡායාරූප නිෂ්පාදනය කිරීමට භාවිතා කළාය. පවනි ඇගේ වැඩවලට ඇලුම් කළ අතර පැය ගණනක් එය කළාය.

සුපුන් ඒ වන විට වැඩ නොකළ නිසා බැංකු ණයක් ලබාගෙන නිව්යෝක්හි වෙළඳසැලක් විවෘත කිරීමට ඔවුහු තීරණය කළහ. මෙය අවදානම් සහගත නමුත් වසරකට අඩු කාලයකට පසු ඔවුන්ට ණය ආපසු ගෙවීමට හැකි විය. කෙසේ වෙතත්, සුපුන් හට නිව්යෝර්ක්හි නිසි රැකියාවක් සොයා ගැනීමට නොහැකි වූ අතර ඔවුන් නැවත පැමිණීමට තීරණය කළහ.

පවනි දැන් වයස අවුරුදු තිස් හයක් වන අතර ඇය සහ සුපුන් පස් හැවිරිදි නිවුන් දරුවන් දෙදෙනෙකුගේ දෙමාපියන්ය. ඔවුන් ජීවත් වන්නේ ශ්‍රී ලංකාවේ නුවර ප්‍රදේශයේය. මීට වසර දෙකකට පෙර, පවනි විසින් නුවර නගරයේ ඡායාරූපකරණ ව්‍යාපාරයක් දියත් කළ අතර, දැන් ශ්‍රී ලංකාව පුරා බලයලත් ඡායාරූප වෙළඳසැල් ජාලයක් ඇය සතුව ඇත.

ඉහත සිද්ධි අධ්‍යයනය භාවිතයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

අ. පවනිගේ ව්‍යවසායක ජීවිතයේ නිර්මාණශීලීත්වයේ කාර්යභාරය කුමක්ද?

(ලකුණු 05)

ආ. නිර්මාණශීලීත්වය පවනිගේ ළමා වියට බලපෑවේ කෙසේද යන්න පැහැදිලි කරන්න?

(ලකුණු 08)

ඇ. පවනිගේ සිහින ඉටුකර ගැනීමට ඇගේ අධිෂ්ඨානශීලීත්වය සහය වූයේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

ඉ. පවනිගේ අධ්‍යාපනය ව්‍යවසයකත්වයට කුමන ආකාරයෙන් සහය වූයේද යන්න විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 40)

**ප්‍රශ්න අංක - 02**

අ. පුද්ගලයෙක් ව්‍යවසායකයෙක් වීමට බලපාන හේතු මොනවාද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. ප්‍රායෝගික උදාහරණ සමඟ සාම්ප්‍රදායික ව්‍යාපාර සහ ව්‍යවසායක ව්‍යාපාර අතර වෙනස හඳුනා ගන්න.

(ලකුණු 06)

ඇ. ලොව පුරා හු දේශපාලනික තත්ත්වයන්ගේ වෙනස්වීම් හේතුවෙන් අද උදාවී ඇති ව්‍යවසායක අවස්ථා මොනවාද යන්න ප්‍රායෝගික උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 03**

අ. උපායමාර්ගික අලුත් කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සැබෑ ලෝකයෙන් ප්‍රායෝගික උදාහරණ සමග කෙටියෙන් පැහැදිලි කරන්න,

(ලකුණු 04)

ආ. සමාගමක අනාගත දැක්ම තක්සේරු කිරීම සැලකිල්ලට ගනිමින් වාසි සෙවීම සහ අවස්ථා සොයන හැසිරීම යන සංසිද්ධි දෙකම කෙරෙහි අවධානය යොමු කරණ ආකාරය සැබෑ ලෝකයේ උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. "ව්‍යවසායක ව්‍යාපාරයක සාර්ථකත්වය රඳා පවතින්නේ සම්පත් මෙහෙය වීමට ව්‍යවසායකයාට ඇති හැකියාව මත පමණක් නොව ජාලකරණයේ බලයත් මතය". අනාගතයේදී ව්‍යාපාර දියුණු කිරීම සඳහා ව්‍යාපාරික නොවන අංශවල ජාලකරණය කොතරම් දුරට වැදගත් යැයි ඔබ සිතන්නේද? ප්‍රායෝගික උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

අ. ව්‍යවසායක දිශානතිය සහ ආයතන කාර්ය සාධනය අතර සම්බන්ධය ප්‍රයෝගික උදාහරණ සමඟ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

ආ. වෙනත් සමාජ පාර්ශවකරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී තමන්ගේ ආත්ම විශ්වාසය වැඩි කර ගැනීමට ව්‍යවසායකයින්ට භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. අවදානම් අවම කිරීමේ ක්‍රමවේදයක් ලෙස ආයතනික ව්‍යාපාරකරණයේ කාර්යභාරය ඇගයීමට ලක්කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)